(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 89.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 අගෝස්තු මස 10 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/'15

1.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 2015.08.18 දින ගාල්ල වරාය පොලිසිය කරන ලද පරීක්ෂා කිරීමක දී වරායේ ගාල් කර තිබූ "මහනුවර" නමැති නෞකාව තුළත්, ශ්‍රී ලංකා දක්ෂිණ නෞකා කඳවුරේ සහ එහි සේවා වනිතා ඒකකය සතු ගොඩනැගිල්ලක අවි සහ උණ්ඩ තිබී හමු වූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිසිය මඟින් අනාවරණය කරගත් අවි සහ උණ්ඩවල නීත්‍යානුකූල අයිතිය කවර පුද්ගලයෙකු හෝ ආයතනයක් සතු වන්නේද;

(ii) එම අවි ආයුධ පුද්ගලයෙකුට හෝ ආයතනයකට කවර පනතක් යටතේ පවරා තිබේද;

(iii) එසේ නම්, ඊට බලය ලබා දුන් බලධරයා කවුරුන්ද;

(iv) එම ආයුධ නිෂ්පාදිත රට, වර්ෂය සහ බලපත්‍රය කවරේද;

(v) ආයුධ මිලදී ගත් ක්‍රමය සහ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාවෙන අවි ගබඩාව වරාය පරිශ්‍රයේ පවත්වාගෙන යාමට අවසර තිබේද;

(ii) ඊට අවසර ලබා දී ඇති බලධරයා කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් ඇවන්ට්ගාර්ඩ් සමාගම මුදල් ගෙවන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මේ පිළිබඳව නීතිපතිවරයාගේ නිගමනයන් විෂයභාර අමාත්‍යවරයා වශයෙන් පිළිගන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කමිටුවක් පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

114/'15

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රණවිරු සේවා අධිකාරියේ සේවය කරන ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2013 හා 2014 දී එම අධිකාරියේ ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සැපයීමට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල ඇඳුම් ලබා දුන් ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය, කාන්තා සහ පිරිමි ලෙස කාණ්ඩගත කළ විට, එක් එක් කාණ්ඩයේ එක් අයෙකු වෙනුවෙන් නිල ඇඳුම් සඳහා දරනු ලැබූ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල ඇඳුම් සඳහා තෝරාගත් රෙදි තත්ත්වයෙන් බාල බවත්;

(ii) එම නිසා නිලධාරින් එම ඇඳුම් ප්‍රතික්ෂේප කර ඇති බවත්;

(iii) අධිකාරියේ සභාපතිනිය අත්තනෝමතිකව කටයුතු කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) රණවිරු සේවා අධිකාරියේ නිල ඇඳුම් ගැටලුව විසඳීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

445/’16

3.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 වර්ෂයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, මුදල් අමාත්‍යවරයා වශයෙන් රාජ්‍ය බැංකුවලින් සමූපකාර ව්‍යාපාරයට ලබාදී තිබූ සියලුම ණය කපා හැරීමට ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේද;

(ii) ඒ බව සනාථ කරමින් එවකට විෂයභාර අමාත්‍යවරයා වූ පාර්ලිමේන්තු මන්ත්‍රී බන්දුල ගුණවර්ධන මහතා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනු ලැබුවේද;

(iii) එක් එක් සමූපකාර සමිතිවලින් කපා හරින ලද ණය පිළිබඳ යථා තත්ත්වය අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර දැනුම් දෙන බව කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවට දන්වනු ලැබුවේද;

(iv) මහජන බැංකුව විසින් සමූපකාර සමිතිවලට ලබාදී තිබූ ණය කපාහැරීමට තීරණය කර ඇති නමුත් එම තීරණය මේ දක්වා කිසිදු දිස්ත්‍රික්කයක ක්‍රියාත්මක වී නොමැති බවට රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී දෙන ලද පිළිතුර නිවැරදිද;

(v) ඉහත (iv) හි තීරණය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ණය කපාහැරීමෙන් සමූපකාර සමිතිවලට යම්කිසි ධෛර්යයක් ලබාදීමට ගත් තීරණය ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ඉදිරි පියවර සමූපකාර සමිතිවලට දන්වා යවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

508/'16

4\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ අංක R/0682/T/036 යටතේ ලියාපදිංචි කරන ලද ත්‍රිකුණාමලය, N.C. වීදියේ, අංක 154 දරන ස්ථානයේ පිහිටි මුහියිද්දීන් ජුම්ආ පල්ලියට අයත්, නිශ්චල දේපළ (ඉඩම්, නිවාස හා වෙළඳසැල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේපළ පිහිටා තිබෙන එක් එක් ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(iii) එක් එක් දේපළවලින් මාසිකව ලබන ආදායම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වකුෆ් දේපළවලට අයත් ඔප්පුවල සඳහන් නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වකුෆ් දේපළ පරිහරණයේදී දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා තිබේද;

(ii) එම දේපළ අතරින්, සමහර දේපළ සින්නක්කර ඔප්පු මඟින් කිසියම් පුද්ගලයින්ගේ නමට පවරා තිබේද;

(iii) එසේ නම්, මේ පිළිබඳව ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

562/'16

5\.

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය කාර්මික විද්‍යාලයේ සිදුවූ මුදල් අක්‍රමිකතාව පිළිබඳව එතුමා දන්නේද;

(ii) එසේ නම්, මෙතෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) එම කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂවරයා විසින් සිදුකළ මුදල් වංචාව තහවුරු වීමෙන් පසු ඔහුට ස්ථාන මාරුවක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම ස්ථාන මාරුව මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(v) අදාළ ස්ථාන මාරුව අත්හිටුවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපනය කාර්මික විද්‍යාලයේ වෙනත් ශාඛා එම දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබේද;

(ii) නොඑසේ නම්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වෙන 650,000 ක ජනතාවට මෙම කාර්මික විද්‍යාලය ප්‍රමාණවත්ද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

574/'16

6.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැකිරාව අධ්‍යාපන කලාපයට අයත්, අ/බමුණුගම මුස්ලිම් විද්‍යාලයේ විද්‍යාලපති ධුරය දරමින් සිටි ඒ. එච්. සමූන් මහතා, යම් විනය නියෝගයක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 වගන්තිය අනුව (යොමු අංක උමැප/ අදෙ/07/2/001) විශ්‍රාම ගැන්වීම සඳහා නිර්දේශ කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

(iii) ඒ අනුව, ඔහුගේ විශ්‍රාම පාරිතෝෂික මුදල සහ විශ්‍රාම වැටුප ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

590/'16

7.

ගරු ලකී ජයවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවතින මුළු සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන අතරින් රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව සහ කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි සඳහා කුලී ගෙවීමට සතොස මඟින් වාර්ෂිකව කොපමණ මුදලක් වැය කරන්නේද;

(ii) කුලියට ලබාගත් ගොඩනැගිලි පිහිටා තිබෙන ස්ථාන කවරේද; එම ස්ථානවල හිමිකරුවන් කවුරුන්ද සහ ඔවුන්ට මාසිකව ගෙවන කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ස්ථානවල දැනට පවත්වාගෙන යන සහ වසා දමා ඇති සතොස ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සතොස වෙළඳ ආයතන පිහිටුවීමට කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

632/'16

8.

ගරු ජයන්ත සමරවීර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1948 සිට 2015 ජනවාරි 08 දක්වා කාලය තුළ සැකපිට රක්ෂිත බන්ධනාගාරගත කළ හා චෝදනා ඔප්පු වීමෙන් පසු වැරදිකරුවන් ලෙස සිරගත කළ බෞද්ධ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගත කළ භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට හෝ සිරගත කිරීමට හේතු වූ චෝදනාව හෝ වරද, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගත කළ භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගතව හෝ සිරගත කර සිටි කාලය, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) 2015.01.08 සිට 2016.03.31 දක්වා කාලය තුළ රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන්වහන්සේලාට එල්ල වුණු චෝදනාව, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි කාලය, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"වයඹ හෘද රෝග නිවාරණ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

2.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සැමට සරණ සහන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වැනි වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— 2016 ජුනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගී වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— කාර්මික ආරවුල් පනත යටතේ නියෝග,— කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*13.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**